ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,207 — 1960 සැප්තැම්බර් 30 වැනි සිකුරාද — 30.9.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

I වැනි කොටස: (II) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිට
තනතුරු-ඇබෑර්තු	743
විභාග, විභාග ප්‍රතිඵල ආදිය	—
ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්	746
තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ...	750
බඩු බාහිරාදිය විකිණීම	750
තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ...	—
ආණ්ඩුවේ නොවන දැන්වීම්	—
රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ...	—
වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම්	—
විවිධ දැන්වීම්	—

තනතුරු — ඇබෑර්තු

ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි; කාර්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා ශ්‍රේණි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. නවප්‍රවේශක නිලධාරීහු.—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන් කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස අන් හැම අවස්ථාවකදීම අධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සෑහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැතී වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

සංලක්ෂ්‍යය.—" නව ප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛනයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදි ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

5. **අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රැජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනෙකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදාතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව මවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටින් ද නැද්දැයි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරන ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මූලික කාර්මික අභ්‍යාස ආයතනය, රත්මලාන

උපදේශකයන්ගේ තනතුරු

රත්මලානේ මූලික කාර්මික අභ්‍යාස ආයතනයේ fපිටර් උපදේශක තනතුරක් සහ යාන්ත්‍රික (මැෂිනිස්ට්) උපදේශක තනතුරක් සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූලව පිළියෙලකරගත් ඉල්ලුම්පත්‍ර 1960 ඔක්තෝබර් මස 15 වෙනි දින දවල් 12ට හෝ ඊට පෙර හෝ ලැබෙන ලෙස මා වෙත එවිය යුතුයි. ආකෘතිපත්‍ර සපයනු නොලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරු සඳහා නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රුපියල් 960—72—1,752ක් වන අතර කාර්යක්ෂමතාවය හා සේවා කාලය අනුව රුපියල් 1,320—72—රුපියල් 2,184 වාර්ෂික වැටුප් ක්‍රමය යටතේ උපදේශක විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබීමටද අවකාශ තිබේ.

තෝරාගනු ලැබූ අපේක්ෂකයින්ගේ කාර්යක්ෂමතාවය හා සේවයේ පලපුරුද්ද අනුව භාණ්ඩාගාරයේ අනුමතියට යටත්ව නියමිත වැටුප් ක්‍රමයේ සුදුසු පියවරක පිහිටවනු ලැබේ.

3. **වයස් සීමාව.**—සෑම අපේක්ෂකයෙක්ම 1960 නොවැම්බර් මස 1 වෙනි දිනට තම වයස අවුරුදු 25 ට නොඅඩු බවටත් අවුරුදු 40ට නොවැඩි බවටත් සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. මෙම වයස් සීමාවන් දෙපාර්තමේන්තු සේවකයන් වෙනුවෙන් බලපානු නොලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම් :—**

(1) (අ) කණිෂ්ඨ විභාගය, එක් විෂයයක් ලෙස ඉංග්‍රීසි සහිතව.
  (ආ) උපකරණ භාවිතය හා ඒවායේ නම් පිළිබඳ දැනීම.
  (ඉ) කාර්මික ඇඳීම් පහදා ගැනීමට හැකියාව.
  (ඊ) පිළිගන්නාලද කර්මාන්තශාලාවක අවුරුදු 4කට නොඅඩු ආධුනික සේවා කාලයක් තිබීම.
  (උ) පිළිගත් කර්මාන්තශාලාවක නිරීක්ෂණ කටයුතු සඳහා අවුරුදු 5ක පලපුරුද්දක් සහ ඉන් යටත්පිරිසෙයින් අවුරුදු 2ක් උපදෙස් දීමේ සේවයෙහි නිරතවීම.
  (ඌ) සිංහලෙන් උපදෙස්දීමේ පළපුරුද්දක් තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

හෝ

(2) (අ) පිළිගත් කර්මාන්තශාලාවක පුහුණු කම්කරු ශ්‍රේණියේ යටත්පිරිසෙයින් අවුරුදු 10ක ප්‍රායෝගික සේවා පළපුරුද්දක් තිබීම.
  (ආ) උපදෙස් දීම සිංහලෙන් කෙරෙන බැවින් මනා සිංහල දැනුමක් අවශ්‍යය.
  (ඉ) යටත් පිරිසෙයින් කණිෂ්ඨ විභාගයෙන් සාමර්ථතාවයක තිබිය යුතු අතර එක් විෂයයක් ඉංග්‍රීසි නම් වඩා සුදුසු වේ.

(3) fපිටර් උපදේශක ධුරයට ඉල්ලුම් කරන්නන්ට (fපිටර් වැඩ) සවිකිරීමේ වැඩ (බංකු වැඩ) ගැන දැනීමක් තිබිය යුතුයි. පට්ටල් අළුත්වැඩියා කිරීම් හා සවිකිරීම් පිළිබඳ මූලික දැනීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(4) යාන්ත්‍රික උපදේශක ධුරයට (මැෂිනිස්ට්) ඉල්ලුම් කරන්නන්ට යාන්ත්‍රික උපකරණ වැඩ, පට්ටල් වැඩ (ලේත්), දැතිරෝද කැපීම්, මිලින් හා පොටවල් කැපීම් ඇතුළුව ගාන පට්ටල් වැඩ ආදිය පිළිබඳ දැනීමක් අවශ්‍යය.

(5) හොඳ ශාරීරික සෞඛ්‍යයෙන් හා යහපත් චරිතයකින් සමන්විත විය යුතුයි.

5. **පත්වීමේ කොන්දේසි.**—මේ පදවි ස්ථිර හා විශ්‍රාම සහිතයි. පත් කරනු ලබන අපේක්ෂකයින් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාමාධාර අරමුදලට අවශ්‍ය පරිදි ගෙවිය යුතුයි.

6. **සේවා කොන්දේසි :—**

(අ) පත්කරගනු ලබන අපේක්ෂකයින් වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.
(ආ) ආරම්භයේදී පත්කිරීම අවුරුදු 3ක ආධුනික කාලයකට යටත් වේ.
(ඉ) සේවා කොන්දේසි කර්මාන්තශාලා සේවා කොන්දේසිවලට සමානය.
(ඊ) ඉතා උසස් තත්වයක කාර්යක්ෂමතාවයක් ඇති අවුරුදු 5ක සතුටුදායක සේවාකාලයක් සම්පූර්ණවූවෝ උපදේශක විශේෂ ශ්‍රේණියට උසස්කරනු ලැබීමට සුදුස්සෝ වෙති.

7. අපේක්ෂකයින් තමන්ගේ ඉල්ලුම් පතට පහත දැක්වෙන සහතික ආදියේ පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුයි :—

(අ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය.
(ආ) උප්පැන්න සහතිකය (ආධාර ලබන පාසැල් සඳහා ඇති රෙගුලාසි මාලාව යටතේ නිකුත්කරනලද උප්පැන්න සහතිකය හෝ බව්තීස්ම සහතිකය මේ සඳහා භාරගනු නොලැබේ).
(ඉ) අයදුම්කරුවාගේ සුදුසුකම්, චරිතය හා මේ ධුරයට පත් කිරීමට ඇති සුදුසුකම් ආදිය පිළිබඳ මෑතදී ලබාගත් වැදගත් සහතික තුනක්.

සැලකිය යුතුයි.—මේ සඳහා ඉදිරිපත්කරනු ලබන සහතික පිටපත් ආදිය ආපසු එවනු නොලැබේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) ඡේදයේ පටන්ගැන්මේ පළකර ඇති රජයේ සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසිද බලනු මැනවි. මේ දැන්වීම යටතේ අවශ්‍ය කරුණු කිසිවක් නොතකා හැරිය ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

9. මේ ධුරයන් පිළිබඳව සියලුම ඉල්ලුම් පත්‍ර හා ඒ පිළිබඳ ලියකියවිලි රත්මලානේ මූලික කාර්මික අභ්‍යාස ආයතනයේ වැඩබලන ප්‍රධාන ඉංජිනේරුතැනට ලැබෙන සේ එවිය යුතු අතර, පුද්ගලිකව මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුට නොඑවිය යුතුයි.

ඩබ්ලිව්. ඕ. ප්‍රනාන්දු,
වැඩබලන ප්‍රධාන ඉංජිනේරුතැන.

මූලික කාර්මික අභ්‍යාස ආයතනය.
රත්මලාන, 1960, සැප්තැම්බර් 23.

ආදර්ශ පෝරමය

රත්මලානේ මූලික කාර්මික අභ්‍යාස ආයතනයේ ෆිටර් සහ මැෂිනිස්ට් උපදේශක තනතුරු

(1) (අ) සම්පූර්ණ නම :————.

(ආ) ලිපිනය :————.

(ඉ) වයස සහ උපන් දිනය. (උප්පැන්න සහතිකයේ පිට පතක් ඇමිණිය යුතුයි) :————.

(2) ජාතිය :————.

(3) විවාහකද, අවිවාහකද යන වග :————.

(4) අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ඒවා ලැබූ දිනයන් සමග (පිටපත් ඇමිණිය යුතුයි) :————.

(5) සව්කිරීම/ලියවීම පිළිබඳ පළපුරුද්ද (විස්තර සමග සහතික පිටපත් ඇමිණිය යුතුයි.) :————.

(6) සිංහල දැනීම :————.
සිංහලෙන් උපදෙස් දීමට හැකිද ? :————.

(7) පට්ටල් වැඩ පිළිබඳ සුළු අලුත්වැඩියාකිරීම් කළ හැකිද ? : ————.

(8) පාඨශාලාවෙන් අස්වූවාට පසු කළ රැකී රක්ෂාවල් :————.

(9) පළපුරුද්ද හා ලත් පුහුණුව පිළිබඳ විශෙෂ සුදුසුකම් : ————.

(10) චරිතය පිළිබඳ සහතික ලබාගත් අයගේ නම් හා තත්වය (ඥාතීන් ගෙන් නොවිය යුතුයි) :————.

(11) වෙනත් විස්තර :————.

(12) මවිසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුනු විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් සඳහන් කර තිබෙන බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවොත් මා විසින්ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව, තෝරා පත්කිරීමෙන් පසු ඒ බව දැනගන්ට ලැබුණහොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව මා රාජකාරියෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9576

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

වැල්ලවත්ත කොට්ඨාශයේ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය

වැල්ලවත්ත කොට්ඨාශයේ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය සඳහා අයදුම්පත් 1960 ඔක්තෝබර් මස 24 වැනි දින පස්වරු 3 දක්වා කොළඹ රෙජිස්ට්‍රාර් ජනරාල් තැන විසින් භාරගනු ලැබේ. ඉල්ලුම් පත්‍ර එවිය යුත්තේ මෙම කාර්යාලයෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රයන්හි ය.

2. **පඩි ක්‍රමය.**—මේ තනතුර සඳහා රු. 2,700 යේ වාර්ෂික ස්ථිර වේතනයක් ගෙවනු ලැබේ.

3. **විශෙෂ දීමනා.**—ගෙවල් කුලී වෙනුවෙන් දීමනාවක්, ජීවන වියදම සඳහා දීමනාවක් (ගෙවිය හැකි තෙක්), ජීවන වියදම සඳහා විශෙෂ දීමනාවක් සහ ලිපිකරුවන්ට ගෙවීම සඳහා දීමනාවක් ගෙවනු ලැබේ. වර්ෂයකට ගමන් ගාස්තු සඳහා රු. 300ක විශෙෂ දීමනාවක් ද ඇත.

4. **සේවා තත්ත්වයන් පිළිබඳ විස්තර :—** ...

(i) මේ තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි එකකි.

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයා අවුරුදු 3 ක් යනතුරු ආධුනික තත්ත්වයේ තබනු ලැබේ.

(iii) තෝරා පත් කරගනු ලබන අපේක්ෂකයා විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් තැන විසින් අනුමත කරනු ලැබුවා වූද රෙජිස්ට්‍රාර් කොට්ඨාශයේ මධ්‍යස්ථානයක උපකරණ සහිත කාර්යාලයක් සපයා ගත යුතු වේ. මේ කාර්යාලය සඳහා විශෙෂ දීමනාවක් ගෙවනු ලැබේ. ගෙවන ප්‍රමාණය සලකා බලනු ලබන්නේ පත්වීම දුන් පසුවය.

(iv) කාර්යාලය හැර තබන වේලාවන් :—

සතියේ සාමාන්‍ය දිනවලදී පූර්වභාග 7 සිට 11 දක්වා හා අපරභාග 2 සිට 5 දක්වාද වෙයි. රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි හා ඉරු දිනයන්හි කාර්යාලය හැර තබන වේලාවල් මෙසේය: පූර්වභාග 7 සිට 10 දක්වා සහ අපරභාග 2 සිට 4 දක්වාත්ය.

(v) තෝරා ගන්නා ලද අපේක්ෂකයාට පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදීමට අවසර දෙනු ලැබේ. නමුත් ඔහුට, වානිජ, වෙළඳ හෝ කෘෂිකම් ව්‍යාපාරවල යෙදීමට හෝ වෘත්තීය කටයුතු කරණ සමාගමක වැඩ කිරීමට රෙජිස්ට්‍රාර් ජනරාල් තැනගේ අවසරය නැතුව ඉඩ නැත.

5. **සුදුසුකම් :—**

(i) අපේක්ෂකයා ලාංකිකයෙකු විය යුතුයි. ලාංකිකයා යනුවෙන් අදහස් කරනුයේ ජන්මයෙන්ම ලංකාවේ පුරවැසියෙකුවීම හෝ ලියාපදිංචිවීමෙන් පුරවැසියෙකුවීමයි. සියළුම අපේක්ෂකයන් විසින් ඔහු හෝ ඈ ලාංකිකයෙකු බව සතුටුදායක ලෙස ස්ඵුට කළ යුතු වේ.

(ii) අයදුම් කරුවන් වයස අවුරුදු 25ටත් 50ටත් අතර විය යුතුය.

(iii) සෑම අපෙක්ෂකයෙක්ම—

(අ) ලියාපදිංචි කරනු ලැබූ වෛද්‍යවරයෙක්, හෝ

(ආ) ස්වදේශීය වෛද්‍යවරයෙකු නම් 1941 කේ අංක 17 දරණ ස්වදේශීය ඖෂධ ආඥාපනත යටතේ ලියාපදිංචි වූවකු ; හෝ

(ඉ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තුමා විසින් නිකුත් කරන ලද සහතික පත්‍රයක් දරණ පුද්ගලයෙකු හෝ විය යුතුයි.

6. **අනිකුත් අවශ්‍යතා :—**

(i) රජයේ සේවාවන්හි නියුක්ත සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් එවනු ලබන ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ මාර්ගයෙන් එවිය යුතු වේ. රජයේ සේවයේ ස්ථිර පදවි දරන්නන් විසින් එවනු ලබන ඉල්ලුම් පත්‍ර එකී දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් රජයේ පරිපාලන නීති සංග්‍රහයේ අංක 109 දරණ පරිපාලන නීතිය යටතේ ඔහුව එම සේවයෙන් මුදාහැරිය හැකි හෝ නොහැකි බව අනුමත කොට එවිය යුතුයි.

(ii) අපේක්ෂකයන් දන්වනු ලබන ලද ස්ථානයකට නියමිත වේලාවට සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතුයි. මේ සම්බන්ධයෙන් ගමන් ගාස්තු හා වෙනත් වියදම් ගෙවනු නොලැබේ.

(iii) තෝරාගනු ලැබූ අපෙක්ෂකයා රජයේ සේවකයෙක් නොවන්නේ නම් ඔහුගේ හෝ ඇගේ ශරීර සෞඛ්‍ය තත්ත්වයේ සුදුසුකම් පිළිබඳව වෛද්‍ය පරීක්ෂණයකින් සමර්ථ විය යුතුයි.

(iv) අයදුම්කරු රජයේ විශ්‍රාම වැටුප් ලබන්නෙක් නම් තමා ලබන විශ්‍රාම වැටුප් ගණන ප්‍රකාශ කළයුතුයි.

(v) කිසියම් කෙනෙක් අපෙක්ෂකයෙකු රෙකමදාරු කිරීමට කැමති නම්, සහතික පත්‍රයක් දීමෙන් එය ඉටු කරගත හැක. මේ සම්බන්ධයෙන් යමෙක් යම් අපෙක්ෂකයෙකුට අයථා මාර්ගයෙන් පදවිය ලබාදීම සඳහා ක්‍රියා කළහොත් එය අපේක්ෂකයා නුසුදුසු හැටියට භාරගනු ලැබීමට හේතුවක් වනු ඇත.

(vi) අපේක්ෂකයෙකු තෝරාගනු ලැබීමට ප්‍රථම ඔහුගේ අයදුම් පත්‍රයෙහි යම්කිසි ප්‍රකාශයක් වැරදි බව පෙනීගිය හොත් අයදුම් පත්‍රය ප්‍රතික්ෂෙප කිරීමට සිදු වේ.

(vii) මෙම දැන්වීමේ කරුණුවලට සෑම අන්දමින්ම එකඟ නොවන අයදුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(viii) පත් කරනු ලැබූවන්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස ද, විශේෂයෙන්ම 1956 යේ අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාවේ යෙදවීම පිණිසද, දැනට පනවා ඇති හෝ මින් මතුවට පනවනු ලබන හෝ ඕනෑම ව්‍යවස්ථාවකට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(ix) ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වන කොටසේ II වන ඡේදයේ මුල පළවෙන රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්වීම් වලට අදාලවූ පොදු කොන්දේසි කියවා බලනු මැනවි.

ඒ. එම්. එස්. පෙරේරා,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

1960 සැප්තැම්බර් මස 23 දින,
කොළඹ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේදී ය.

9529

ශුද්ධියක්

ලංකා යුධ හමුදාව—සෙසු නිල පත්වීම්

1960.9.16 දින අංක 12,201 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රිකාවේ I කොටසේ (II) ඡේදයේ 704 වැනි පිටුවේ ඉහත සඳහන් ශීර්ෂය යටතේ පලවන නිවේදනයේ 4 ඡේදයේ (එ) (1) උපඡේදයේ පළමුවැනි පේලිය ඉදිරියෙන් ඇති "වයස අවුරුදු 20ට අඩුවිය යුතුයි" යන්න "වයස අවුරුදු 25 ට අඩුවිය යුතුයි" කියා නිවැරදි විය යුතුය.

9577

ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

ඩී. එල්. එෆ්. ටෙන්ඩර් දැන්වීමයි

ප්‍රවාහන හා රජයේ වැඩ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, 1960 නොවැම්බර් 23 වෙනි දින පෙරවරු 11 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවට පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. 1960 නොවැම්බර් 24 වෙනි දින පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන බැවින් ඒ සඳහා පැමිණ සිටීමට කැමති ටෙන්ඩර් කරුවන් හට එසේ කළහැක :—

ද්‍රව්‍ය	ටෙන්ඩර් අංකය
1. ස්ප්‍රේ මෙටලයිසිං අව්ට්ෆිට් ...	ඩී. එල්. එෆ්. 45
2. පික්-අප් ට්‍රක් රථ ...	ඩී. එල්. එෆ්. 61

කොළඹ පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට පෙර, ටෙන්ඩර් කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන් ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1960 සැප්තැම්බර් 23 වෙනි දින,
කොළඹ 2.

9575

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

තිස්සමහාරාම උප කොට්ඨාශයේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි බෝදගම ආර මහ වැව බැම්ම තැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් අයදුම් පත්, කොළඹ තැ. පෙ. අංක 500 මහා ලේකම් ගොඩනැගිල්ලේ අංක 355 දරණ කාමරයෙහි කෘෂිකර්ම, ඉඩම්, වාරි මාර්ග හා විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 ඔක්තෝබර් මස 25 වැනි කුජ දින පූර්ව භාග 10 වන තෙක් භාරගනු ලැබේ.

වාරිමාර්ග, දුම්රිය සහ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවලින් එකක රුපියල් 1,00,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ පස් වැඩ කිරීමට යෝග්‍ය යන්ත්‍ර ඇති කොන්ත්‍රාත් කරුවනට මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක. තංගල්ලේ දකුණු කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්ම අනු පිටපතක් සමග පූරවා ඉදිරිපත් කළ යුතුය.

රුපියල් 200ක ටෙන්ඩර් ඇප මුදලක් වාරිමාර්ග අධ්‍යක්‍ෂ කාර්යාලයේ හෝ කොළඹින් පිටනම් ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් කාර්යාලීය වේලාවක් තුළ 1960 ඔක්තෝබර් මස 21 වැනි කිවි දින හෝ ඊට පෙර තංගල්ලේ දකුණු කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් පෝර්ම ලබාගත හැක.

බා. සෙල්ලහේවා,
වාරිමාර්ග අධ්‍යක්‍ෂ වෙනුවට.

1960 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

9434

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මඩකලපුවේ නැගෙනහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලීය ගොඩනැගිල්ල විශාල කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ මහ ලේකම් ගොඩනැගිල්ලේ 355 වැනි කාමරයෙහිවූ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 නොවැම්බර මස 1 වෙනි අඟහරුවාදා පෙරවරු 10.00 වන තෙක් භාර ගනු ලැබේ.

වාරිමාර්ග හෝ දුම්රිය හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රු. 90,000කට නොඅඩු ගණනකට ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ඉල්ලුම් කළ හැක.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 100ක් වාරිමාර්ග අධ්‍යක්‍ෂ තැනගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 ඔක්තෝබර 28 වෙනි සිකුරාදා දක්වා ටෙන්ඩර් පෝර්ම කොල දෙනු ලැබේ.

වැඩි විස්තර මඩකලපුවේ ප්‍රදේශිය වාරිමාර්ග ඉජිනේරු තැනගෙන් ලබා ගත හැක.

බා. සෙල්ලහේවා,
වාරිමාර්ග අධ්‍යක්‍ෂ වෙනුවට.

කොළඹ,
1960.9.21.

9519

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

සෑහැල්ලු න්‍යුමැටික් ග්‍රයින්ඩර්ස් සැපයීම

වාරිමාර්ග අධ්‍යක්‍ෂ තුමා විසින් වර්ෂ 1960 නොවැම්බර් මස 1 වැනි අඟහරුවාදා උදේ 10 වන තෙක් සැහැල්ලු න්‍යුමැටික් ග්‍රයින්ඩර්ස් තුනක් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් අයැදුම් පත් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර් අයැදුම් කරුවනට ඒ ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ඇත.

රත්මලානේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් අයැදුම් පත් ලියා අනු පිටපතක් ද සමග එවිය යුතුය.

ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 25ක් රත්මලානේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ලබා ගෙන එය ඉදිරිපත් කළ විට වර්ෂ 1960 ඔක්තෝබර් මස 28 වෙනි සිකුරාදා වනතෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රත්මලානේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

බා. සෙල්ලහේවා,
වාරිමාර්ග අධ්‍යක්‍ෂ වෙනුවට.

වර්ෂ 1960ක් වූ සැප්තැම්බර් මස 22 වැනි දින,
කොළඹ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දී.

9526

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහනුවර මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් හසලක ඉදිකෙරෙන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ ස්ථිර නිවාස (ගොඩනැගිලි අංක 48) දරන ගොඩනැගිල්ල සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රු. 32,000කට හෝ ඊට වැඩියෙන් හෝ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන්ගෙන්, 1960 ඔක්තෝබර් මස 26 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 10 වන තෙක් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර බාර ගනු ලැබේ.

2. වේරගන්තොට හසලක වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රිකා පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතු වන අතර, සැලසුම් හා සියළුම විස්තර ඔහුගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

3. එක ටැන්ඩරයකට රුපියල් 50 බැගින්, හසලක වාරිමාර්ග උප කොට්ඨාශ කාර්යාලයේ හෝ මහනුවර කච්චේරියේ මුදල් තැන්පත් කොට ලබාගත් රිසිට් පතක් සමග සුදුසු කම් ඔප්පු කළ අයට පමණක් 1960 ඔක්තෝබර් මස 3 වැනිදා සිට 1960 ඔක්තෝබර් මස 24 වෙනිදා වන තෙක් ටැන්ඩර් පත්‍රිකා දෙනු ලැබේ.

4. දනට රජය යටතේ කොන්ත්‍රාත් වැඩ කරගෙනයනු ලබන ටෙන්ඩර්කරුවන් විසින් එම වැඩවල ප්‍රගතිය පිළිබඳව එය බාර නිලධාරියාගෙන් ලබාගත් සහතිකයක් ටැන්ඩර් පත්‍ර ඉල්ලා සිටීමේදී ඉදිරිපත් කළ යුතුය.

5. මහනුවර මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින්, මහනුවර පරණ කච්චේරි ගොඩනැගිල්ලේ පිහිටි ප්‍රාදේශික වාරිමාර්ග කාර්යාලයේදී 1960 ඔක්තෝබර් මස 26 වෙනි දින පෙරවරු 10.30ට ටැන්ඩර් පත්‍ර විවෘත කරන අතර, ඒ අවස්ථාවේ අවශ්‍ය නම් ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටිය හැක.

6. ටැන්ඩර් බාරගනු ලබන අවසාන දිනයේ සිට සති 3ක් යනතුරු ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ ගණන් හිලව් නොවෙනස්ව තබාගත යුතුය.

7. වැඩි විස්තර වේරගන්තොට, හසලක වාරිමාර්ග උප කොට්ඨාශ භාර ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ඩී. සී. වට්මෝර්,
හසලක උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැන.

1960 සැප්තැම්බර් මස 16 වෙනි දින,
වේරගන්තොට, හසලක වාරිමාර්ග කාර්‍යාලයේ දීය.

9518 බී

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

මඩකලපුව දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී තැන විසින් පහත සඳහන් ස්ථානවලට පහත සඳහන් දෑ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1960.10.18 දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ:—

(1) කරදියන් ආරු ගොවිපළ—පොල් අතු 4,000—දිග අඩි 6 වියන ලද පළල 13".

(2) කරදියන් ආරු ගොවිපළ—අඹ—2,500. සමන්තුරෙයි ගොවිපල—අඹ—4,000 (ඇඹුල්) අඹ ඇට හොඳට ඉදුනු කෘමීන්ගෙන් තොර පැළකිරීමට ඇට ගැනීමට සුදුසු විය යුතුයි.

2. මඩකලපු කෘෂිකර්ම කාර්යාලයේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක් සහිතව ලියුම් කවරයක බහා, සීල් තබා "සභාපති ටෙන්ඩර් මණ්ඩලය, මඩකලපුව දිස්ත්‍රික් කෘෂිකර්ම කාර්‍යාලය" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කෙළවරෙහි "පොල් අතු සැපයීම" හෝ "අඹ සැපයීම" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 7ක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්වද ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර, ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් නො එවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් මඩකලපුවේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී තැනට ඒවා අතින්ම භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "පොල් අතු සැපයීම" හෝ "අඹ සැපයීම" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය. ලියාපදිංචි කළ තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුනහොත් ඔහු මඩකලපුවේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී තැනගෙන් වහාම ඒ ගැන කරුනු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේ දී ඉදිරියේ සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී මඩකලපුවේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති කාර්‍යාලයේ දී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත ෆෝරමයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද, පිළිගනු ලැබුවාවූද දේවල මුළු ගණනින් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමාගේ නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කර නිමවූ විට පමණකි. පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළ හොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

9. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති 3කටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබා ගනු ලැබේ.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කාර්ය සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම්, පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ රටවැසියෙක්වූ තැනැත්තෙක්ය යන්නයි.

13. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපැලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සලකනු ලැබේ.

14. වර්ෂ 1934 දී, 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු විසින් හෝ සේවකයෙකු වෙනුවෙන් හෝ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා විරුද්ධ වන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නො ලැබේ.

17. වැඩි විස්තර මඩකලපුවේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී තැනගෙන් දැනගත හැක.

ඒ. වී. රිචර්ඩ්ස්,
වැඩබලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960 සැප්තැම්බර් මස 22 වැනි දින,
පේරාදෙණියේ දීය.

9560

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම

කොළඹ, එඩින්බරෝ චන්ද්‍රවංක අංක 42 දරණ ස්ථානයේ පිහිටා තිබෙන ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ත්‍රිකුණාමලේ දිස්ත්‍රික්කයේ කිලිවෙඩ්ඩි හි පිහිටා තිබෙන නියමිත මිල යෝජනා ක්‍රමයේ ගබඩාවට 1961 දෙසැම්බර් මස 31 දින දක්වා කම්කරු හා ප්‍රවාහන සේවා සැපයීම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් ඉල්ලුම් පත් 1960 ඔක්තෝබර් මස 21 වෙනි සිකුරාද අ. භා. 2.30 වනතුරු භාරගනු ලැබේ.

2. ත්‍රිකුණාමලේ කච්චේරියට රුපියල් 50 ක තැන්පත් මුදලක් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සියක් එහි නියෝජ්‍ය ආහාර පාලක තුමාට ඉදිරිපත් කර 1960 ඔක්තෝබර් මස 20 වෙනි බ්‍රහස්පතින්දා දවල් 12 වනතුරු නිකුත් කරනු ලබන ටෙන්ඩර් ඉල්ලුම් පත් ලබාගෙන අනුපිටපතක්ද සහිතව පුරවා එවිය යුතුය.

3. වැඩි විස්තර ත්‍රිකුණාමලේ නියෝජ්‍ය ආහාර පාලක තුමාගෙන් හෝ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තුමාගෙන් ලබාගත හැකිය.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් තැන වෙනුවට.
(නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම)

1960.9.25,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
336, ඩීන්ස් පාර, කොළඹ 10.

9520

අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1960 ඔක්තෝබර් මස 21 වන කිව් දින පෙරවරු 10.30 වන තෙක් පහත සඳහන් වන වැඩ සඳහා ටැන්ඩර් පත්‍ර කොළඹ 3, තර්ස්ටන් පාර බ. ප. අධ්‍යාපන කාර්යාලයේ ටැන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ:—

පාසැලේ නම	කළයුතු වැඩය
1. කො/මාලාබේ ජ්‍යෙෂ්ඨ පාසැල	වහලය ප්‍රතිසංස්කරණය
2. කො/යබරලුව මි. පාසල ...	රෙපයේරුව
3. ක/උඩුවර මි. පාසැල ...	රෙපයේරුව
4. මි/දෙරණෑගොඩ ප්‍රා. පාසැල	රෙපයේරුව

සංක්ෂ්‍යය : කො = කොළඹ දිස්ත්‍රික්කය
ක = කළුතර දිස්ත්‍රික්කය
මි = මීගමු දිස්ත්‍රික්කය

2. අංක 1-4 යන වැඩවලට රු. 5,000කට හෝ ඊට වැඩි ගණනකට ගොඩනැගිලි තැනීම සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ අංක 1-4 යන වැඩවලට රු. 10,000ට හෝ ඊට වැඩි ගණනට ගොඩනැගිලි තැනීම සඳහා ප්‍රසිඬ වැඩදෙපාර්තමේන්තුවේ ලියා පදිංචිව සිටින්නාවූද, අංක 1-4 වැඩවලට රු. 10,000 කට නොඅඩු ගණනකට ගොඩනැගිලි වැඩ භාරගැනීමට සුදුසුයයි සමුපකාර රෙජිස්ට්‍රාර්තුමා හෝ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමා හෝ කම්කරු කොමසාරිස් තුමා හෝ බටහිර පළාතේ අධ්‍යාපන නිලධාරිතැන වෙත නිර්දේශය කරනු ලබන අනුමත සමිතිවලටද අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ කාර්යාලයේ (ඒ. සී. ශාඛාව) හෝ කොළඹින් පිට කච්චේරියක හෝ රු. 100ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක්, කොළඹ 3, බටහිර පළාතේ අධ්‍යාපන නිලධාරි තැන වෙත ඉදිරිපත් කරන්නාවූද අයට 1960.10.20 වන දින පස්වරු 3.30 වන තෙක් ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චැක් පත්, මනි ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාර ගනු නොලැබේ. අනුමත සමිති තැන්පත් කරනු ලබන මුදලින් නිදහස් කරනු ලැබේ.

3. ටැන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් (එස්. ඩබ්ලිව්. ශාඛාවෙන්) හෝ බස්නාහිර පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත යුතුය. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ දෙවන ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියාපදිංචිව ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

4. පූර්වෝක්ත 2 වන ඡේදයේ සඳහන් වන පරිදි අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත් ටැන්ඩර් පෝර්ම එවිය යුත්තේ දෙවන පිට පතකුත් සමගය. සියලුම විස්තර හා තොරතුරු බස්නාහිර පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් දැනගත හැකිය. සැලැස්ම එහිදී බලා ගත හැකිය. තැපැලෙන් එවන ටැන්ඩර් පත්‍ර "ටැන්ඩර් සභාවේ සභාපති, බ. ප. අධ්‍යාපන කාර්යාලය, තර්ස්ටන් පාර, කොළඹ 3" යන ලිපිනයට රිජිස්ටර් තැපැලෙන් එවියයුතුය. ප්‍රාදේශීය ටැන්ඩර්කරුවන් විසින් ටැන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපැලෙන් නොඑවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටැන්ඩර් පත්‍ර බ. ප. අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර නිලධාරි තැනට භාර දී, එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුය. එසේ භාර දෙන ටැන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටැන්ඩර් කරුගේ නමද, ලිපිනයද වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

5. 1960 ඔක්තෝබර් මස 21 වන කිව් දින පෙරවරු 10.30 ට කොළඹ 3, තර්ස්ටන් පාර බ. ප. අධ්‍යාපන කාර්යාලයේදී ටැන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටැන්ඩර් විවෘත කරන විට ටැන්ඩර්කරුවන්ට විවෘත කරන ස්ථානයෙහි සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටැන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ගාස්තු ප්‍රමාණයද (රේට් ගණන් ද) ටැන්ඩර් කරුවන්ගේ නම්ද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

6. ටැන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටැන්ඩර් පත්‍ර භාරගැනීම අවසාන කර සති 6කට නොඅඩු කාලයක් තුළ සවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

7. වෙනත් අවශ්‍ය විස්තර කොළඹ 3, බස්නාහිර පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැකි අතර ටැන්ඩර් ලියකියවිලි ද මෙහිදී පරීක්ෂාකර බැලිය හැකිය.

8. තෝරාගනු ලැබූ ටැන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන්ය. ටැන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගතයුතුය. සේවයේ යෙදියයුත්තේ ලාංකික කම්කරුවන් හා ටැන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන්ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටැන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ, සේවයේ යෙදීමට අධ්‍යාපනාමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්ෂ වරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සලකනු ලැබීමට ද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමට ද යටත් වේ. ලාංකික නොවූ හෝ ටැන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහතකී අනුමතිය හෝ සම්මතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

ඩබ්ලිව්. ඇම්. ඒ. වර්ණසූරිය,
බ. ප. අධ්‍යාපන නිලධාරි තැන.

1960 සැප්තැම්බර් මස 23 වැනි දින,
කොළඹ 3, බ. ප. අධ්‍යාපන කාර්යාලයේදීය.

9551

අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1960 ඔක්තෝබර් මස 21 වෙනි සිකුරාදා පෙරවරු 10.30 වන තෙක් මහනුවර, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ:—

පාසැලේ නම		කළයුතු වැඩ
(1) මහ/මාරස්සන පාසැල	ප්‍රාථමික	ඉතිරි වැඩ නිම කිරීම.

සංක්ෂ්‍යය.—මහ = මහනුවර.

2. ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන කොන්ත්‍රාත් කරුවන් රු. 15,000ට නොඅඩු ගණනකට ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රු. 7,500 ට නොඅඩු ගණනකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේද, ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී සිටිය යුතුයි.

3. තවද, අනුමත කරනලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමුපකාර සමිති අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචිවී සිටිත් නම් එම සමිතිවලටද ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක.

එකී සමිති ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කිරීමේදී, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී නැත්නම් රු. 15,000ට නොඅඩු ගණනකටද, ගොඩනැගිලි වැඩ කිරීමේ හැකියාවක් තිබෙන බවට සහතික කරනලද ලියකියවිලි, සමුපකාරසමිති සඳහා නම් සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් තුමාගෙන් ද, ග්‍රාම සංවර්ධන සමිති සඳහා නම් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතුමාගෙන් ද, කම්කරු සමුපකාර සමිති සඳහා නම් කම්කරු කොමසාරිස් තුමාගෙන් ද, ලබාගෙන මධ්‍යම පළාතේ අධ්‍යාපන නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතුයි.

4. වර්ෂ 1960 ඔක්තෝබර් මස 20 වෙනි බ්‍රහස්පතින්දා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර අපේක්ෂකයින් විසින් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ (ඒ. සී. ශාඛාවේ) හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි මහනුවර අධ්‍යාපන නිලධාරි තැනට ඉදිරිපත් කළ යුතුයි. චැක්පත්, මනිඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

5. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ වව්චර් කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් (ගොඩනැගිලි ශාඛාවෙන්) හෝ මහනුවර අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත යුතුය. මුදල් තැන්පත් කිරීමේ වව්චර් නිකුත් කරනු ලබන්නේ ඉහත පෙනෙන 2 වන හා 3 වන ඡේදයන්හි සඳහන්වන මුදල් ප්‍රමාණයන් අනුව ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ට හා සමිතිවලට පමණකි.

6. ඉහත සඳහන් 2 වන හා 3 වන ඡේදයන්හි දැක්වෙන පරිදී මහනුවර අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ දෙවන පිටපතකුත් සමගය. සියළුම විස්තර හා තොරතුරු මහනුවර අධ්‍යාපන නිලධාරි තැනගෙන් දැනගත හැකිය. සැලැස්ම වල්ද එහිදී බලාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර මහනුවර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා වෙත රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් මහනුවර අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර නිලධාරි තැනට භාරදී, එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුයි. එසේ භාර දෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

7. වර්ෂ 1960 ඔක්තෝබර් මස 21 වෙනි සිකුරාදා පෙරවරු 10.30ට මහනුවර අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට විවෘත කරන ස්ථානයෙහි සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද ටෙන්ඩර් කරුගේ නමද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

8. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබූ අවසාන දින සිට සති 6කට නොඅඩු කාලයක් තුළ සවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

9. වෙනත් අවශ්‍ය විස්තර මහනුවර අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් සම්බන්ධ ලියකියවිලිද මෙහිදී පරීක්‍ෂා කර බැලිය හැක.

10. වැඩය භාරගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියළුම සේවකයින් ලාංකිකයින් විය යුතුවා පමණක් නොව වැඩය කෙරෙන ප්‍රදේශයෙන්ම තෝරාගැනීමට සෑම උත්සාහයක්ම දැරිය යුතුය. ලාංකික වූ හා වැඩය කෙරෙන ප්‍රදේශයෙහිවූ සේවකයින් පමණක් වැඩෙහි යෙදවීම කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්‍ෂවරයා විසින් අවසර දෙනු ලබන විශෙෂ අවස්ථාවන් හිදී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසිය නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සලකනු ලැබීමටද කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වේ. එවැනි අනුමතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කෙරෙන ප්‍රදේශයෙහි නොවූ සේවකයින් වැඩෙහි යෙදවීම තහනම්ය.

ජී. එච්. බී. ඒකනායක,
ම. ප. අධ්‍යාපන නිලධාරි තැන.

අධ්‍යාපන කාර්යාලය, මහනුවර,
1960 සැප්තැම්බර් මස 22 දින.
9563

ආහාර දෙපාර්තමේන්තුවේ මැනිං වෙළඳ සැලේ ආපණශාලාව සම්බන්ධවයි

1. මැනිං වෙළඳ සැලේ කාර්ය මණ්ඩලය සහ මැනිං වෙළඳ සැලේ සමූපකාර කම්කරු සමිතියේ සාමාජිකයන්ට 60.10.25 දින පටන් අවුරුද්දක් තුළ ආහාර පාන සැපයීම සඳහා කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "මැනිං වෙළඳ සැලේ ආපන ශාලාව සඳහා ටෙන්ඩර් පත්‍ර" යනුවෙන් සඳහන් කළ සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 60.10.15 දින දවල් 12 දක්වා මා විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා සහ වෙනත් විස්තර මැනිං වෙළඳ සැලේ සහකාර ආහාර පාලක තැනගෙන් ලබාගත හැක.

2. ටෙන්ඩර් පත්‍ර දෙපිටපතක් සහිතව එකම කවරයක් තුළ බහා "සහකාර ආහාර පාලක තැන, මැනිං වෙළඳ සැල, කොළඹ 11" යන ලිපිනයට එවිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් විස්තර අනුව සියළුම කෑම වර්ගවල හා බීම වගර්වල මිළ ගණන් වෙන් වෙන් වශයෙන් සඳහන් කළ යුතුය.

4. කෑම වර්ග සූදානම් කිරීම සඳහා මැනිං වෙළඳ ශාලා භූමියේ තිබෙන මුළුතැන්ගෙය පාවිච්චි කළ යුතුය. පිළිගත් ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා තමාගේම උයන ලිප් භාවිතා කළ යුතුයි. ඒවාට විදුලි එළිය, ගෑස් එළිය, භූමිතෙල් හෝ වෙනත් ඉන්ධන තමන් විසින්ම සැපයිය යුතුය. තවද, ඒවායේ වියදම ඔහු විසින්ම දැරිය යුතුය.

5. ටෙන්ඩරය පිළිගත් බව දැන්වීමෙන් පසු දින 3ක් ඇතුළතදී පිළිගත් ටෙන්ඩර්කරු විසින් ආහාර කොමසාරිස්වරයාගේ කාර්යාලයේ රුපියල් 100ක් තැන්පත් කළ යුතුය. එසේ තැන්පත් කළ මුදල, පිළිගත් ටෙන්ඩර්කරු තමාගේ ගිවිසුම සතුටුදායක ලෙස සම්පූර්ණ කරනු සඳහා ඇප මුදලක් වශයෙන් තිබෙන අතර, එම කාලය තුළදී තමාගේ ගිවිසුම ක්‍රියාවේ යෙදවීමට බැරි වුවහොත් හෝ ගිවිසුම සම්පූර්ණ නොකළහොත් ඒවාට අලාභහානි ගෙවීමට ඔහු විසින් බැඳී සිටින බවද ආහාර කොමසාරිස්වරයාට ඒත්තු යන පරිදි ගිවිසුම සම්පූර්ණ කළහොත් ගිවිසුම අවසානයේදී ඇප මුදල ආපසු ගෙවන බවද සැළකිය යුතුය.

6. පිළිගත් ටෙන්ඩර්කරු විසින් ආපණශාලාවේ කුලිය සඳහා මසකට රු. 35ක් ද, බත් කඩයක් ගෙන යෑමට සඳහා නගර සභාවේ බලපත්‍රයට මුදල් ගෙවීමටද එකඟ විය යුතුය.

7. ටෙන්ඩර් පත්‍ර එකක් හෝ සියල්ලම ප්‍රතික්‍ෂෙප කිරීමට ආහාර කොමසාරිස්වරයාට බලය තිබේ.

8. ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන්වීමෙන් පසු අවශ්‍ය මුදල් තැන්පත් කළ විට කොන්ත්‍රාත්කරු ආහාර කොමසාරිස්වරයා සමග ගිවිසුමකට ඇතුළත් වේ. පොරොන්දු පත්‍රයට අලවන මුද්දරවලට යන වියදම පිළිගත් ටෙන්ඩර්කරු විසින් ඉසිලිය යුතුය.

9. පිළිගත් ටෙන්ඩර්කරු ආපනශාලාවේ කෑම ගන්නා අයට ආචාර ශීලී සහ නිහතමානී විය යුතුය.

10. පිළිගත් ටෙන්ඩර්කරු කෑමවල මිල දර්ශනයක් (භාෂා තුනෙන්ම) ආපනශාලාවේ පහසුවෙන් බලාගත හැකි ස්ථානයක තැබිය යුතුය.

11. පිළිගත් මිළ, ආපනශාලාවේ කෑම ගැනීමට අයිතියක් ඇති සෑම දෙනාටම එක සමානවිය යුතුය.

12. පිළිගත් ටෙන්ඩර්කරු විසින්, ආපනශාලාව, මේස, පිඟන්, හැඳි පිළි ආදිය සහ කුස්සියේ උපකරණ නිතරම පිරිසිදුව තබාගත යුතුය.

කේ. එම්. ඩී. ජයනෙත්ති,
ආහාර කොමසාරිස්.

60.9.27.
කොළඹ.
9138

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

බිත්තර ඇසිරීමට කාඩ්බෝඩ් රාක්ක සහ පියන් සපයා ගෙන දීම

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ මරදානේ තිබෙන "ට්‍රිපොලි" වෙළඳ සැලට බිත්තර ඇසිරීමට කාඩ්බෝඩ් රාක්ක 1,000 ක් සහ කාඩ්බෝඩ් පියන් 750 ක් සපයා ගෙනදීම පිණිස වුවමනා "කෝටේෂන්" ඉල්ලුම් පත් කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ අලෙවි කිරීමේ සංවර්ධන කොමසාරිස් තැන විසින් 1960 ඔක්තෝබර් මස 28 වැනි සිකුරාද සවස 2.30 දක්වා භාර ගනු ලැබේ.

ඒ සඳහා වුවමනා "කෝටේෂන්" ඉල්ලුම් පත් අනුපිටපතක් ද සහිතව ලබා ගැනීම 1960.10.28 වැනි දින දවල් 12 දක්වා වේ.

ඇම්. ඇස්. විජේරත්න,
අලෙවි කිරීමේ කොමසාරිස් තුමා වෙනුවට.

1960 සැප්තැම්බර් මස 19 වැනි දින,
කොළඹ කොටුවේ චැතැම් වීදියේ
අංක 62 දරණ ස්ථානයේ පිහිටි
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.
9467

ජාතික නිවාස දෙපර්තමේන්තුව

මහනුවර, කටුගස්තොට, ගාලවත්ත, 1ඩබ්ලිව්. වර්ගයේ ගෙවල් 43ක් සහ ළිං 4ක් තැනීම

1960.8.26 දින දරණ ගැසට් පත්‍රයෙහි 1960.8.19 දාතමින් පළවූ ඉහත සඳහන් දැන්වීම සම්බන්ධයෙන් ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය 1960 ඔක්තෝබර් මස 28 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තෙක් දීර්ඝ කර ඇත.

1960 ඔක්තෝබර් මස 24 වෙනි සඳුදා පස්වරු 3 වන තුරු මුදල් තැන්පත් කර ටෙන්ඩර් පත්‍ර ලබා ගත හැක.

ආර්. ඇල්. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 544,
කොළඹ 2,
1960 සැප්තැම්බර් මස 22 වෙනි දින,
9532

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

නාඋල මිල පාලන ක්‍රම ගබඩාවක් තැනීම සඳහා එවන ටෙන්ඩර් **පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස්** හවුස්හි පිහිටි ප්‍රවාහණය සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහිවූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 ඔක්තෝබර් මස 20 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. නාලන්ද ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 ඔක්තෝබර් මස 7 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 203,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු 250 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : “ වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝප රේෂන් ”

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය:

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ
වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.9.24.

9559/1

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

හැඳල ලාදුරු ආරෝග්‍යශාලාවේ ජලය සැපයීම, සංවර්ධනය අතිරේක වැඩ සහ විශේෂ අළුත්වැඩියා කිරීම් සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහිවූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 ඔක්තෝබර් මස 20 වෙනි බ්‍රහස්පතින්ද පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බ්‍රහස්පතින්ද පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ ටොරිංටන් චතුරශ්‍රයේ උතුරු කොළඹ භාර ආ. වැ. දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 ඔක්තෝබර් මස 7 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි සහ ජලය සැපයීමේ වැඩ සඳහා රුපියල් 12,000 ට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : “ වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝප රේෂන් ”

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ
වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.9.24.

9559/2

තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

රාජකීය ලංකා නාවික හමුදාව

1960 සැප්තැම්බර් මාසයේදී ටෙන්ඩර් සම්බන්ධයෙන් ගන්නා ලද අවසාන තීරණය :—

සේවයේ ස්වභාවය	ටෙන්ඩර් කරුගේ නම	පිළිගත් ගාස්තු ප්‍රමාණය රු. ශ.	සමර්ථවූ ටෙන් ඩර් කරුගේ නම
කොළඹ වරායෙහි තිබෙන රාජකීය ලංකා නාවික හමුදාවට අයත් යාත්‍රාවලින් කසල ඉවත් කිරීම	ඩුබෑෂ් බෝට් සහ ලයිටරේජ් සමාගම	22 50...	ඩුබෑෂ් බෝට් සහ ලයිටරේජ් සමාගම
		40 0...	
		55 0...	
		67 50	
		27 50	
		55 0	
		67 50	
		85 0	
		2 50	
		5 0	
		7 50	
		10 0	
		3 0	
		6 0	
		9 0	
		12 0	
		30 0	
		37 50	
		3 0	
		3 50	

ජී. ආර්. ඇම්. ද මැල්
රියර් අද්මිරාල්, නාවික හමුදාධිපති.

මූලස්ථානය,
රාජකීය ලංකා නාවික හමුදාව,
තැ. පෙ. 593, කොළඹ
1960 සැප්තැම්බර් මස 22 වැනි දින

9497

බඩු බාහිරාදිය විකිණීම

වැඩ කළ නො හැකි වාහනයක් විකිණීම

අංක සී. ඇල් 7959 දරණ ඔස්ටින් ලොරිය 1960 ඔක්තෝබර් 7 වැනි දින පෙරවරු 10.00ට බෝපතලාවේ රජයේ ගොවිපලේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තෝරාගත් ඉල්ලුම්කරු මුළු වටිනාකම ඒ මොහොත්ම ගෙවා, දින තුනක් ඇතුළත වාහනය ගෙනයාමට සූදානම් විය යුතු යි.

සතියේ දිනයන්හි කළමනාකාර තැන සමඟ කලින් නියම කරගත් පරිදි උදේ 10.00 සිට පස්වරු 4.30 දක්වා ඉහත සඳහන් ස්ථානයේදී වාහනය පරීක්ෂාකර බැලිය හැක.

ආ. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1960 සැප්තැම්බර් මස 17 වැනි දින,
පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ය.

9428

ජාතික කිරි මණ්ඩලය

පාවිච්චියට නුවුවමනා බඩු බාහිරාදිය විකිණීම

පාවිච්චියට නුවුවමනා ටයර්, ටියුබ්, බෝතල්, ටින්, කැන් යනාදිය 1960 ඔක්තෝබර් මස 13 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 10ට නාරාහේන්පිට පිහිටි ජාතික කිරි මණ්ඩලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මේ බඩු බාහිරාදිය 1960 ඔක්තෝබර් මස 12 වැනි බදාදා පෙරවරු 10ටත් දහවල් 12ටත් අතර කාලය තුළදී ප්‍රධාන ගබඩාකරු හමුවීමෙන් පරීක්ෂා කළ හැකිය.

මෙම බඩු ලබාගන්නන් විසින් බඩුවල සම්පූර්ණ මුදල එවේලේම ගෙවා ඒවා වෙන්දේසි දිනයෙහි පස්වරු 4ට පෙර ගෙන යා යුතුය.

සභාපති,
ජාතික කිරි මණ්ඩලය.

ජාතික කිරි මණ්ඩලය,
තැ. පෙ. අංක 1155,
කොළඹ 5.
24.9.60.

9558 ✓

ජාතික නිවාස දෙපාර්තමේන්තුව

සාප්පු ගොඩනැගිලි කුලියට දීම

කොළඹ බිලුමෙන්ඩල් පාරේ තනා ඇති සාප්පු ගොඩනැගිලි දෙකක් සහ සිරිපනා පටු මාවතෙහි අංක 160 දරණ සාප්පු ගොඩනැගිල්ලද කුලියට දීම සඳහා 1960 වේ ඔක්තෝබර් මස 22 ද පෙරවරු 10 ට කොළඹ පාර්සන්ස් පාරේ පිහිටි මගේ කාර්‍යාලයේදී වෙන්දේසියක් පැවැත් වේ.

එක් ගොඩනැගිල්ලක විශාලත්වය හතරැස් අඩි 600 කි. බිලුමෙන්ඩල් පාරේ පිහිටි එක ගොඩනැගිල්ලක මාසික කුලිය රුපියල් 125ක් වන අතර, සිරිපිනා පටු මාවතේ ගොඩනැගිල්ල සඳහා මාසික කුලිය රුපියල් 130 ක් වේ.

එක් ගොඩනැගිල්ලක් සඳහා ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ හැකි අඩුම ලන්සුව රුපියල් 500 ක් වන අතර, වෙන්දේසියේදී ඉදිරිපත් විය හැක්කේ ලංකා පුරවැසියන්ට පමණකි. සාප්පු ගොඩනැගිල්ල ලබා දීමට පෙර තෝරා ගනු ලැබූ අය ඔහු ලංකා පුරවැසියකු බවට සාක්ෂි ඔප්පු කළ යුතුවේ.

ඉහළම ගණනක ලන්සුව ඉදිරිපත්. කරන තැනැත්තාට ඒ ඒ ගොඩනැගිල්ල කුලියට ගැනීමේ අයිතිය පවරනවා ඇත. ඉහත සඳහන් මූලික මුදලට අඩු ලන්සුවක් භාර ගනු නොලැබේ.

සිය තීරණයට හේතු නොපෙන්වා ලන්සුවක් පිළිගැනීමේ හෝ නොපිළිගැනීමේ අයිතිය කොමසාරිස් තුමා කෙරෙහි තබා ගනු ලබනවත් හැර ඔහුගේ එකී තීරණය අවසාන තීරණය වන්නේය.

තෝරා ගනු ලැබූ ඉල්ලුම්කරු ඔහුගේ ලන්සුව පිළිගත් වහාම ලන්සුවේ වටිනාකමෙන් සියයට 25 ක් සහ තුන් මසක කුලී ප්‍රමාණය තැන්පත් මුදලක් සේ කොමසාරිස් තුමාට ගෙවිය යුතුය. ඉතිරි මුදල සති දෙකක් තුළදී නොගෙව්ව හොත්, තැන්පත් කරන ලද මුදල රාජසන්තක වේ. තැන්පත් කරන ලද ලන්සුවේ වටිනාකම ආපසු ගෙවනු නොලැබේ. තෝරා ගනු ලැබූ ඉල්ලුම්කරු තමන්ගේ ලන්සුවේ වටිනාකම සහ තුන් මසක කුලී ගෙවූ පසු පහත සඳහන් කොන්දේසි අඩංගු ගෙවල් කුලී ගිවිසුමකට අත්සන් තැබිය යුතුය:—

(අ) ජාතික නිවාස කොමසාරිස් ගෙන් ලියවිල්ලකින් ලබාගත් අනුමැතිය නොමැතිව තෝරා ගත් ඉල්ලුම් කරු ගොඩනැගිලි වල පදිංචිකරුවන් වූ විට තමන්ට කුලියට දෙන ලද ගොඩනැගිල්ල වෙනත් අයකුට කුලියට දීම, විකිණීම, තෑගි කිරීම, උකස් කිරීම හෝ වෙනයම් විදියකින් ඔහුගේ අයිතිය අන් අයකුට පැවරීම නොකළ යුතුය ;

(ආ) තෝරා ගත් ඉල්ලුම්කරු ගොඩනැගිල්ලේ පදිංචිකරු වූ විට එම ගොඩනැගිල්ල සිය වියදමෙන් අළුත්වැඩියා කොට සෑම අවස්ථාවේම යථා තත්ත්වයෙන් තබා ගත යුතුය. තමන්ට කුලියට දී ඇති ගොඩනැගිල්ල වටා තාප්පයක් හෝ වැටක් ඉදි කොට එය යථා තත්ත්වයේ තබා ගත යුතුය ;

(ඇ) තෝරා ගත් ඉල්ලුම්කරු ගොඩනැගිල්ලේ පදිංචියට පැමිණි පසු ඔහුට පවරා ඇති පදිංචිය හමාර වූ විට එම ගොඩනැගිල්ල ඊට සවිකර ඇති සෑම දෙයක්ම මනා තත්ත්වයකින් අමතරව ඉදිකර ඇති ගොඩනැගිල්ල සහ වැඩි දියුණු කර ඇති කොටස්ද සමග ජාතික නිවාස කොමසාරිස් තැනට භාර දිය යුතුය. යම් අමතර කොටස් ඉදිකර ඇතහොත් ඒ සඳහා කිසිම අලාභයක් පදිංචිකරුට ගෙවනු නොලැබේ.

(ඈ) අවුරුදු පහකට වරක් අවශ්‍ය වුවහොත් ගෙවල් කුලී සංශෝධනය කරනු ලැබේ. මේ සම්බන්ධව වැඩි විස්තර ජාතික නිවාස කොමසාරිස් තැනගෙන් ලබාගත හැක.

ආර්. ඇල්. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

කොළඹ 2.
9499

විශෙෂ නිවේදනයයි

1960 ඔක්තෝබර් 19 වැනි බදාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1960 ඔක්තෝබර් 21 වැනි දින නිකුත්කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1960 ඔක්තෝබර් 15 වැනි සෙනසුරාදා පස්වරු 12.30ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1960 සැප්තැම්බර් 27 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.